# 2 ශ්‍රී ලංකාව ජනාවාස වීම

## හැඳින්වීම

ශ්‍රී ලංකාව මිනිස් වාසයක් බවට පත් වූයේ මීට අවුරුදු එක්ලක්ෂ විසිපන්දහසකට පමණ ඉහත කාලවකවානුවක දී ය. ඉන්දියානු සාගරය හරහා මෙහි පැමිණි නූතන මානවයා නමින් හැඳින්වෙන හෝමොසාපියන්වරු එසේ මෙරටට සංක්‍රමණය වූහ. එතැන් පටන් ඔවුහු මෙරට විවිධ ප්‍රදේශවලට පැතිර යමින් ඒ ඒ පළාත්වල තිබෙන පරිසර ස්වරූපවලට හැඩ ගැසුණහ. සැලකිය යුතු තරමේ දීර්ඝ කාලයක් ඔවුන් මේ රටේ ජීවත් වීම නිසා කාලානුරූපව ඔවුන්ගේ සංස්කෘතිය ද සකස් විය. සංස්කෘතියේ සිදු වූ එම වෙනස්කම් පදනම් කොට ගෙන ශ්‍රී ලංකාවේ මනුෂ්‍ය පැවැත්මේ ඉතිහාසය අවධි තුනකට බෙදා තිබේ. ඒ අවධි කෙබඳු ස්වරූපයේ ඒවා දැ යි යන කාරණයත් ඒ අදාළ කාලවකවානුවල දී ඔවුන් ජීවත් වූ ආකාරය ගැනත් මෙම පාඩමේ දී ඔබට විස්තර කර දෙනු ඇත.

## 2.1 ප්‍රාග් ඓතිහාසික යුගයේ ජනාවාස

සාහිත්‍ය මූලාශ්‍රය මඟින් විස්තර කරන අතීත කාලයේ ආරම්භයට පෙර තිබූ යුගය පොදුවේ හැඳින්වෙන්නේ ප්‍රාග් ඓතිහාසික යුගය නමිනි. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට සංස්කෘතික අවධි දෙකක් අයත් ය. එයින් පළමුවැන්න දීර්ඝ කාලයක් තිස්සේ පැවති ගල් යුගය යි. දෙවන යුගයට අයත් වන්නේ ශාක ආහාර මත යැපීම වෙත වැඩි නැඹුරුවක් තිබූ සහ ලෝහ භාවිතය සහ ස්ථිරවාසී ජනාවාස ආරම්භ වන කාලපරිච්ඡේදය යි. මේ අතරින් ගල්යුගය හැඳින්වීමට ප්‍රාග් ඓතිහාසික යුගය යන ව්‍යවහාරයත් දෙවන අවධිය හැඳින්වීමට පූර්ව ඓතිහාසික යුගය යන යෙදුමත් භාවිත කෙරේ.

### ජනාවාස ව්‍යාප්තිය

ශ්‍රී ලංකාව ජනාවාස කරන ලද්දේ ආදි කාලීන හෝමෝ සාපියන් මානවයා විසිනි. එකී මානවයා මෙරට විවිධ දේශගුණික කලාපවලට අනුවර්තනය වෙමින් පුළුල් භූගෝලීය ප්‍රදේශයක ව්‍යාප්ත විය. දඩයමින් සහ තැන තැන ඇවිද යමින් ආහාර එකතු කිරීම ඔවුන්ගේ ප්‍රධාන යැපීම් උපාය මාර්ගය යි.

ශ්‍රී ලංකාවේ ගල්යුගයට අයත් සාක්ෂි හමුවන තැන් දෙකක් තිබේ. එයින් පළමුවැන්න රත්නපුර සහ එහි අවට ප්‍රදේශවල පිහිටි මැණික් පතල් ය. සාමාන්‍යයෙන් පොළව මට්ටමේ සිට අඩි 90 ක් පමණ ගැඹුරින් මෙම පතල්වල හමුවන ඉල්ලම් නමින් හැඳින්වෙන බොරලු මිශ්‍ර පස් තට්ටුවේ ඉතා ඈත යුගයක විසූ මිනිසුන් විසින් භාවිත කරන ලද ගල් මෙවලම් සහ වඳ වී ගිය ඇතැම් සතුන්ගේ ඇටකැබලි තැන්පත්ව තිබේ. ප්ලයිස්ටොසීන භූ අවධියේ දී පැවති අධික වර්ෂා සහිත කාලගුණය නිසා කඳුකර ප්‍රදේශ සෝදා යැමෙන් හටගත් බොරලු තට්ටු මෙසේ පහත් බිම්වල තැන්පත් විය.

ශ්‍රී ලංකාවේ අර්ධශුෂ්ක කලාපයේ පොළවේ මැටි සහිත වැලි පසකින් වැසුණු බොරලු තට්ටුවක් තිබේ. පුරාවිද්‍යාඥයින් විසින් එය හඳුන්වා තිබෙන්නේ ඉරණමඩු සැකැස්ම යන නමිනි. ඉරණමඩු සැකැස්ම තැන්පත් වූයේ ප්ලයිස්ටොසීන යුගයේ පැවති කෙටි උණුසුම් කාලවල දී ය. මෙම බොරලු තට්ටුවෙන් ද මෙරට ගල්යුගයට අයත් මෙවලම් හමු වේ.


### 2.1.1 විවිධ දේශගුණික කලාපවල ජනාවාස ව්‍යාප්තිය

ශ්‍රී ලංකාවේ ප්‍රධාන පරිසර කලාප 8 ක ගල් යුගයට අයත් ප්‍රජාව ජීවත් වී තිබේ. මෙම පරිසර කලාප නම් (1) පහතරට ශුෂ්ක කලාපය (2) පහතරට අර්ධශුෂ්ක කලාපය (3) පහතරට වියළි කලාපය (4) පහතරට අතරමැදි වියළි කලාපය (5) කඳුකර වියළි අතරමැදි කලාපය (6) පහතරට අතරමැදි තෙත් කලාපය (7) තෙත් කඳුකර කලාපය සහ (8) තෙත් උස් කඳුකර කලාපය යි.

මෙම පරිසර කලාප තීරණය කිරීමට ප්‍රධාන වශයෙන් සැලකිල්ලට ගනු ලබන්නේ වාර්ෂික වර්ෂාපතන අගයන්වල වෙනස්කම් ය. වර්ෂාපතනයේ වෙනස්කම් අදාළ ප්‍රදේශවල වාසය කරන සතුන්ටත් ශාක ප්‍රජාවටත් සෘජු බලපෑමක් ඇති කරයි. එහෙයින් එකිනෙකට වෙනස් පරිසර කලාපවලට අනුවර්තනය වූ ගල් යුගයේ වැසියන්ගේ ආහාර පරිභෝජනයේ සහ තාක්ෂණයේ යම් යම් විවිධතා ඇති විය. නිදසුනක් ලෙස පහතරට තෙත් කලාපයේ විසූ ගල්යුගයේ ප්‍රජාව සිය ආහාරය සඳහා ගොඩබිම ජීවත් වන බෙල්ලන් වැඩි වශයෙන් යොදා ගත්හ. විවිධ බෙල්ලන් වර්ග



*නොමිලේ බෙදා හැරීම සඳහා ය.*




*සිතියම අංක 2.1 දැනට සොයා ගෙන තිබෙන ශ්‍රී ලංකාවේ ප්‍රාග්ඓතිහාසික ස්ථානවල ව්‍යාප්තිය දැක්වෙන සිතියම. (A) පහතරට අර්ධ ශුෂ්ක කලාපය (B) පහතරට වියළි කලාපය (C) පහතරට අතරමැදි වියළි කලාපය (D) පහතරට තෙත් කලාපය (E) කඳුකර වියළි අතරමැදි කලාපය.*

## ශ්‍රී ලංකාවේ දැනට සොයාගෙන තිබෙන ප්‍රාග් ඓතිහාසික ස්ථාන නාමාවලිය


1 එලිෆන්ට්පාස්
2 පූන්කරි
3 පරන්තන්
4 ඉරණමඩු
5 මූලතිව්
6 වෙල්ලන්කුලම්
7 මාන්කුලම්
8 මුරුක්කන්
9 නච්චියාර් වෙල්ලච්චි මලෙයි
10 ත්‍රිකුණාමලය
11 කුදිරමලෙයි
12 මෝදරගම්ආරු
13 මරිච්චිකඩ්ඩි
14 විල්පත්තු
15 අනුරාධපුරය
16 සන්නන්කුල්ලි
17 පොම්පරිප්පු
18 කලාඔය
19 වනාතවිල්ලු
20 කන්දකාඩු
21 ත්‍රිකෝණමඩු
22 අර්නකල්ලු
23 පොළොන්නරුව
24 පලාවි
25 පුත්තලම
26 ආණමඩුව
27 ආඬිගම
28 පල්ලම
29 බිංගදෙනිය
30 හලාවත
31 දඹුල්ල
32 තම්මැන්නාගල
33 පිදුරංගල
34 අලිගල
35 මාපාගල
36 පොතාන
37 අලකොලවැව
38 වැවල
39 කළුදියපොකුණ
40 මහනුවර
41 පේරාදෙණිය
42 දානිගල
43 හේනේබැද්ද
44 නිල්ගල
45 බිබිලේ
46 ගම්පොල
47 මඩොල්සිම
48 වැලිමඩ
49 පූඩළු ඔය
50 නාවලපිටිය
51 කිතුල්ගල බෙලිලෙන
52 බෙලිලෙන ඇතුල
53 අවිස්සාවේල්ල
54 බියගම
55 කැලණිය
56 කොළඹ
57 මල්වාන
58 ගැටහැත්ත
59 බටතොටලෙන
60 දිඹුල
61 දික්ඔය
62 සමනලකන්ද
63 මස්කෙලිය
64 නොර්වුඩ්
65 නුවරඑළිය
66 බණ්ඩාරවෙල
67 රාවණාඇල්ල
68 හොර්ටන්තැන්න
69 බගවන්තලාව
70 ඇහැලියගොඩ
71 එල්ලාවල
72 කුරුවිට
73 බටදොඹලෙන
74 කළු ගඟ
75 රත්නපුර
76 පැල්මඩුල්ල
77 බෙලිගල්ගේ
78 බෙල්ලන්බැඳිපැලැස්ස
79 බෙලිහුල් ඔය
80 උක්ගල්කල්තොට
81 අලුගල්ගේතෙලුල්ල
82 බුත්තල
83 ඔක්කම්පිටිය
84 පොතුවිල්
85 කුඩුම්බිගල
86 ලේගම
87 බඹරගස්තලාව
88 ඕකන්ද
89 ඉටිකල
90 කුමන
91 උඩපොතන
92 මිනිහාගල්කන්ද
93 ගල්ගේ
94 තෙලුල්ල
95 දියවින්න
96 කහවත්ත
97 කුකුලේගම
98 බදුරලිය
99 කලවාන
100 රක්වාන
101 අලුගල්ගේ
102 අඟුණකොලපැලැස්ස
103 වලවේ ගඟ
104 තිස්සමහාරාමය
105 යාල
106 බූන්දල
107 හම්බන්තොට
108 අම්බලන්තොට
109 වැලිපටන්විල
110 හුංගම
111 රන්න
112 තංගල්ල
113 මාතර
114 ගාල්ල

පහතරට තෙත් කලාපයේ සුලබ ය. එහෙත් මෙම තත්ත්වය සහතරට වියළි කලාපයේ දක්නට නැත. එම ප්‍රදේශවල දඩයම් කරන ලද්දේ මුවා, තලගොයා ආදී වියළි කලාපීය පරිසරයේ වැඩි වශයෙන් ජීවත් වන සතුන් ය.

## 2.1.2 කාලවකවානු

ශ්‍රී ලංකාවේ දකුණු පළාතට අයත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටි පතිරාජවෙල නම් ප්‍රදේශයේ පොළව මතුපිට සිට අඩි 45 ක් ගැඹුරින් පිහිටි ඉරණමඩු සැකැස්මට අයත් බොරලු තට්ටුවෙන් ගල් යුගයට අයත් සාක්ෂි සොයා ගෙන තිබේ. මෙම බොරලු තට්ටුව ප්‍රකාශ උත්තේජිත සන්දීප්තතා (Optically Stimulated Luminescence) ක්‍රමය නමින් හැඳින්වෙන විද්‍යාත්මක විශ්ලේෂණය මඟින් දින නිර්ණය කිරීමේ දී එය මින් පෙර වසර 125 000 ක් පැරණි බව තහවුරු වී තිබේ. එම දිස්ත්‍රික්කයට ම අයත් බූන්දල වැල්ලේගංගොඩ ප්‍රදේශයේ පොළව මතුපිට සිට අඩි 24 ක් යටින් පිහිටි ගල්මෙවලම් සහිත බොරලු තට්ටුව මින් පෙර වසර 80 000 ක කාලවකවානුවකට අයත් ය. ආසන්න වශයෙන් මෙයින් පෙර වසර 125 000 ක සිට අවම තරමින් ක්‍රිස්තු පූර්ව 1800 දක්වා මෙම ගල්යුගය අඛණ්ඩව පැවතිණි. ශ්‍රී ලංකාවේ පළාත් කිහිපයකින් එම සංස්කෘතියේ දීර්ඝකාලීන පැවැත්ම තහවුරු කරන දින වකවානු ස්ථිර කොට තිබේ.


| | |
|---|---|
| *පාහියන්ගල* | *වසර 38 000* |
| *කුරුවිට බටදොඹලෙන* | *වසර 28 000* |
| *කිතුල්ගල බෙලිලෙන* | *වසර 15 000* |
| *බෙල්ලන්බැඳිපැලැස්ස* | *වසර 12 000* |
| *අත්තනගොඩ අළුලෙන* | *වසර 10 350* |
| *මානියම්ගම* | *වසර 7 900* |
| *සීගිරිය පොතාන* | *වසර 5 800* |
| *සීගිරිය අලිගල* | *වසර 5 500* |
| *උඩමළල* | *වසර 5 330* |
| *මාතොට* | *වසර 3 800* |
| *හෙනගහපුගල* | *වසර 3 370* |



*ඡායාරූපය අංක 2.1 කළුතර දිස්ත්‍රික්කයට අයත් බුලත්සිංහල පාහියන්ගල පිහිටි මෙම ගල් ගුහාව මීට අවුරුදු 35 000 ඉහත කාලයක දී ප්‍රාග් ඓතිහාසික මානවයන්ගේ වාසස්ථානයක්ව පැවතිණි. පාහියන්ගල ලෙන ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපයේ ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මිනිසුන්ගේ ජීවිතය පිළිබඳ වැදගත් තොරතුරු අනාවරණය කර තිබේ.*



*නොමිලේ බෙදා හැරීම සඳහා ය.*



*ඡායාරූපය අංක 2.2 ශ්‍රී ලංකාවේ මධ්‍යශිලා යුගයට අයත් ජ්‍යාමිතික හැඩයෙන් යුත් ගල්මෙවලම් කිහිපයක්. මේවා නිපදවා තිබෙන්නේ බිම්වීදුරු නමින් හැඳින්වෙන පිරිසිදු තිරිවානා ගල්වලිනි.*

### 2.1.3 ජනාවාසවල මූලික ලක්ෂණ

ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ජනාවාස රටේ පවතින එකිනෙකට වෙනස් පරිසර තත්ත්වවලට අනුවර්තනය වෙමින් ව්‍යාප්ත විය. ආහාර සඳහා අවශ්‍ය කරන ස්වභාවික සම්පත් බහුල ප්‍රදේශවල වාසය කිරීමට ඔවුහු වැඩි කැමැත්තක් දැක්වූහ. පහතරට වැසි වනාන්තර ප්‍රදේශ, වියලි කලාපීය වනාන්තර, මුහුදුබඩ කලපු සහ විල්ලු ආශ්‍රිත ප්‍රදේශ, කඳුකර තණබිම් ආදී තැන්වල ඔවුන් වාසය කර ඇති බව සොයා ගෙන තිබේ. ජලය පහසුවෙන් ලබා ගත හැකි තැන් සහ ගල් මෙවලම් තනා ගැනීමට අවශ්‍ය කරන පාෂාණ වර්ග බහුල ප්‍රදේශවල ජීවත් වීමට ඔවුන් රුචියක් දැක්වීය. වියලි කාලගුණයක් පවත්නා කාලවල දී එළිමහන් තැන්වලත් වර්ෂා සහගත කාලවල දී ස්වභාවික ගල්ගුහාවලත් ඔවුන් ජීවත් වී තිබේ. දැනට හඳුනාගෙන තිබෙන එවැනි ප්‍රාග් ඓතිහාසික එළිමහන් කඳවුරු සහ ගල්ගුහා වාසස්ථාන කිහිපයක් පහත දක්වා තිබේ.

1. මිනිහාගල්කන්ද, බුන්දල, පතිරාජවෙල (වෙරළාශ්‍රිත එළිමහන් කඳවුරු)

2. පාහියන්ගල,බටදොඹලෙන, කිතුල්ගල බෙලිලෙන (පහතරට තෙත් කලාපීය ලෙන්)

3. සීගිරියේ පොතාන සහ අලිගල (පහතරට වියළි කලාපීය ලෙන්)

4. බෙල්ලන්බැඳිපැලැස්ස (පහතරට වියළි කලාපීය එළිමහන් කඳවුරු)

5. බණ්ඩාරවෙල, හෝර්ටන්තැන්න (කඳුකර එළිමහන් දඩයම් ස්ථාන)


### 2.1.4 ජීවන රටාව

මෙම යුගයේ ජනතාව දඩයම් කිරීමෙන් සහ තැන තැන ඇවිද ආහාරයට ගත හැකි ස්වාභාවික දේ එකතු කර ගනිමින් සිය ජීවිකාව පවත්වා ගෙන ගියේය. එහෙයින් ඔවුහු වර්ෂයේ වැඩි කාලයක් සංචාරක ජීවිතයක් ගෙවූහ. වර්ෂාධික කාලවල දී ස්වාභාවික ගල්ගුහාවල ජීවත් වූහ.

ජනගහනය, කුඩා කණ්ඩායම් ලෙස සංවිධානය වී තිබිණි. සාමාන්‍යයෙන් එක් කණ්ඩායමකට සාමාජිකයින් 1525 ත් අතර ප්‍රමාණයක් ඇතුළත් විය. එවැනි කණ්ඩායමකට අයත් වූ උපරිම සංඛ්‍යාව 50 කි.

සාමාජිකයින් 5 දෙනෙකුගෙන් යුත් පවුලකට ජීවත් වීම සඳහා වර්ග මීටර 50 ක පමණ ප්‍රදේශයක් ප්‍රමාණවත් වූ බව පෙනේ. බණ්ඩාරවෙල චර්චිහිල් නම් ස්ථානයෙන් සොයා ගත් ගල්යුගයට අයත් ස්ථානයේ වපසරිය වර්ග මීටර 150කි. එහි පුද්ගලයින් 25 දෙනෙකු ජීවත් වන්නට ඇතැ යි අනුමාන කෙරේ. බෙල්ලන්බැඳිපැලැස්සේ ගල්යුගයට අයත් ප්‍රජාව ජීවත් වූ තැන වපසරිය වර්ග මීටර 120 කි. එතැනින් මිනිස් ඇටසැකිලි 30 ක් සොයා ගැනිණි.

මෙම යුගයට අයත් පුද්ගලයින්ගේ ආහාරයේ ස්වභාවය තීරණය වූයේ ඔවුන් ජීවත් වන පරිසරයෙන් ලබා ගත හැකිව තිබූ සම්පත්වල ස්වභාවය අනුව යි. වියළි කාලවල දී ඔවුහු විවෘත ස්ථානවල තාවකාලිකව අටවා ගත් කඳවුරුවල කල් ගෙවූහ. ආහාර සෙවීමේ



*සිතුවම අංක 2.1 ඉහත සිතුවමේ දක්වා ඇති ආකාරයේ කුඩා ජ්‍යාමිතිකාකාර ගල් මෙවලම් භාවිතයේ දී ඒවා ලී දඬුවක හෝ සතෙකුගේ ඇට කැබැල්ලක අමුණා සකස් කරගෙන තිබේ.*



*නොමිලේ බෙදා හැරීම සඳහා ය.*



*සිතුවම අංක 2.2 තම පවුලේ සාමාජිකයකු හෝ එකට ජීවත් වූ ඥාතියකු මියගිය පසු වාසය කළ ගල් ගුහාව තුළ ම වැලලීම ප්‍රාග් ඓතිහාසික ජනයාගේ සිරිතක්ව තිබිණි. පසුකලෙක ඇට සැකිලි ගොඩට ගෙන ඒවායේ රතු පැහැති ගුරුගල් ආලේප කර කිසියම් යාතුකර්මයක් කළ බවට සාක්ෂි හමුවී තිබේ.*

කටයුතු සඳහා ඒ මානවයෝ දිනකට කිලෝමීටර 7 ක පමණ දුරක් ඇවිද ගියහ. ගල්ගුහාවල ගත කරන ලද්දේ තාවකාලික ජීවිතයක් වූ හෙයින් ඇතැම් අවස්ථාවල තමන්ගේ මියගිය ඥාතීන්ගේ මළසිරුරු ගුහා ඇතුළත වළ දැමූහ. ඇතැම් අවස්ථාවල ලී දඬුවක් හෝ අං කැබැල්ලක ආධාරයෙන් ඒ සඳහා වළක් හාරා තිබේ. අනතුරුව මළසිරුරු ඒ වළේ තැන්පත් කොට කසළ රොඩුවලින් එය වසා දැමී ය. කිතුල්ගල බෙලිලෙන ඇතුළත එලෙස මිහිදන් කළ පුද්ගලයින් 12 දෙනෙකුගේ ඇටසැකිලි සොයා ගැනිණි. විවෘත ස්ථානයක් වූ බෙල්ලන්බැඳිපැලැස්සේ ගල් යුගයට අයත් සොහොන් බිමෙහි ඇටසැකිලි 30 ක් තිබිණි. පාහියන්ගල ගල්ගුහාවෙන් අවධි කිහිපයකට අයත් පුද්ගලයින් 9 දෙනෙකුගේ ඇටසැකිලි කොටස් සොයා ගැනිණි.


## 2.1.5 ආහාර රටාව

මෙරට ගල් යුගයේ විසූ මිනිසුන්ගේ ආහාර කෙබඳු වී දැ යි අවබෝධ කර ගැනීමට ඉවහල් වන වැඩිමනක් සාධක ලැබෙන්නේ පහතරට වියළි කලාපයේ සහ තෙත් කලාපයේ පිහිටි ගල්ගුහාවලිනි. දැනට සොයා ගෙන තිබෙන සාක්ෂි අනුව ආහාරය සඳහා දඩයම් කළ සතුන් අතර ගවරා, කුළු මීහරකා, කළු වළහා, වල්ඌරා, ගෝනා, තිත්මුවා, මීමින්නා, ඉත්තෑවා, හාවා, දඬුලේනා, හම්බාවා, මුගටියා, උරුලෑවා, වඳුරා, වලිකුකුළා, හබන්කුකුළා, පිඹුරා සහ තලගොයා ද වේ. මාංශජනක ධාතු බහුල මිරිදිය මාළු වර්ග ද අල්ලා ගෙන ආහාරයට යොදා ගෙන තිබේ. පහතරට තෙත් කලාපයේ තිබෙන ස්වාභාවික දියකඩිතිවල සිටින තිත්තයින් ආදි මසුන් මෙසේ අල්ලා ගෙන තිබේ.

පිෂ්ටය ලබා ගැනීමට භාවිත කළ ශාක ආහාර අතර වල්දෙල් සහ කැලෑකෙසෙල් ප්‍රධාන ය. කිතුල්ගල බෙලිලෙනෙන් වසර 12 500 කට ඉහත කාලවකවානුවක දී පුළුස්සා ආහාරයට ගන්නා ලද කැලෑදෙල් ඇට පිළිබඳ සාක්ෂි හමු වී තිබේ. මීට අමතරව පිෂ්ටය බහුල ආහාර ලෙස ගෝනල, කටුඅල, කිතුල් ඇට සහ දෝතලු ඇටවල මදය ද අනුභව කර තිබේ. ආහාර පුළුස්සා අනුභව කළ බවට සාක්ෂි



*නොමිලේ බෙදා හැරීම සඳහා ය.*



*ඡායාරූපය අංක 2.3 ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ජනාවාසයකින් සොයාගන්නා ලද පබළුවක්. මෙය සතෙකුගේ අස්ථි කැබැල්ලකින් සකස් කරන ලද්දකි.*


පරීක්ෂා කළ තැන් කිහිපයකින් ම සොයා ගනු ලැබ ඇත.

ගොළුබෙල්ලන් ආහාරයට ගැනීමට ප්‍රාග් ඓතිහාසික වැසියන් මහත් රුචියක් දැක්වීය. විශේෂයෙන් ම පහතරට තෙත් කලාපයේ ජීවත්වන ගස්ගොළුබෙල්ලන් සහ කලපුවල ජීවත්වන බෙල්ලන් මෙසේ ආහාරය සඳහා ගෙන තිබේ. සිය ආහාරය සඳහා අවශ්‍ය කරන ලුණු ලබා ගැනීමට රට ඇතුළත ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික වැසියෝ ඉතා දුර බැහැර ගමන් කළෝ ය. කිතුල්ගල බෙලිලෙනෙන් සොයා ගන්නා ලද කලපු බෙල්ලන්ගේ අවශේෂ මුහුදුබඩ ප්‍රදේශවලින් රැගෙන ආ ලුණු සමග මිශ්‍ර වී පැවති ඒවා බව හඳුනා ගෙන තිබේ.

### 2.1.6 තාක්ෂණය

මේ යුගයට අයත් තාක්ෂණය ගැන දැන ගැනීමට තිබෙන එක ම සාධකය ගල් මෙවලම් ය. එහෙත් රත්නපුරයේ මැණික් පතල්වලින් සහ ඉරණමඩු සැකැස්මෙන් සොයා ගෙන තිබෙන ගල් මෙවලම් ආශ්‍රයෙන් ගල් යුගයේ තාක්ෂණය ගැන සම්පූර්ණ අදහසක් ගොඩ නැගීම අපහසු ය. ඊට හේතුව ප්‍රමාණවත් ගල් මෙවලම් ප්‍රමාණයක් නොලැබීමත් ඒවායේ දිනවකවානු පිළිබඳ දැනට තිබෙන දැනුම ප්‍රමාණවත් නොවීමත් නිසා ය.

මෙරට ගල් යුගයේ තාක්ෂණය පිළිබඳව විස්තරාත්මක දැනුමක් ලබා ගැනීමට ඉවහල් වන්නේ පුරාවිද්‍යාඥයින් විසින් ජ්‍යාමිතික ක්ෂුද්‍ර ශිලාමෙවලම්



*ඡායාරූපය අංක 2.4 ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඉතිහාසය නියෝජනය කරන මධ්‍ය ශිලා යුගයට අයත් මිනිස් ඇටසැකිල්ලක්. මෙය සොයාගන්නා ලද්දේ සීගිරියට යාබදව පිහිටි පොතාන ගල් ගුහාවෙනි (ඡායාරූපය පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය අනුග්‍රහයෙනි)*

යනුවෙන් හඳුන්වන කුඩා ප්‍රමාණයේ ගල් මෙවලම් ය. මේවා එසේ නම් කර තිබෙන්නේ ඒවා නිෂ්පාදනය කරන්නට වෑයම් කළ පුද්ගලයින් එකී මෙවලම්වලට ජ්‍යාමිතික හැඩයක් ලබා දීමේ අරමුණින් ගල්පතුරු හැඩ ගස්වා තිබෙන නිසා ය. මෙවැනි මෙවලමක් දිගින් සෙන්ටිමීටර 4.5 කට වඩා විශාල නොවේ. වැඩි වශයෙන් තිරිවානා ගල් සහ සුළු වශයෙන් කහඳ ගල් භාවිත කොට මෙකී ක්ෂුද්‍ර ගල් මෙවලම් නිෂ්පාදනය කර තිබේ. සමස්තයක් වශයෙන් ගත් විට වැඩි වශයෙන් නිපදවා තිබෙන්නේ ජ්‍යාමිතික නොවූ ක්ෂුද්‍ර ගල් මෙවලම් ය. මේවා සතුන් දඩයම් කිරීමේ සිට කැපීම්, සීරීම්, තැලීම්, හැරීම් වැනි දේට උචිත පරිදි සකසා ඇත. මීට අමතරව කළුගල් භාවිත කොට තනන ලද මිටි, ඇඹරුම්ගල් ආදිය ද එකල නිපදවා තිබේ.

## 2.1.7 මිනිසුන්ගේ ශරීරයේ ස්වභාවය

මෙතෙක් සොයාගෙන තිබෙන ඇටසැකිලි ශ්‍රී ලංකාවේ ගල් යුගයට අයත් මිනිසුන්ගේ ශරීර ස්වභාවය කෙබඳු වී දැ යි යන කාරණය අවබෝධ කර ගැනීමට ඉවහල් වෙයි. සාමාන්‍යයෙන් වැඩුණු පිරිමියෙකුගේ උස සෙන්ටිමීටර 174 කි. වැඩුණු කාන්තාවක් සෙන්ටිමීටර 166 කට වඩා නොඋස් ය. ඔවුන් සියලු දෙනාගේ දත් විශාල ය. පළල් නාසයක් සහ නිකටක් ඔවුන්ට තිබිණි. වැඩිහිටි පිරිමියෙකුගේ මොළයේ විශාලත්වය ඝන සෙන්ටිමීටර 1600 කි. වැඩුණු ගැහැනු අයකුගේ එය ඝන සෙන්ටිමීටර 920 කි. මානව විද්‍යාඥයන්ගේ අදහස අනුව ප්‍රාග් ඓතිහාසික මානවයාගේ උපරිම ආයු කාලය වසර 3540 පමණ වන්නට ඇතයි සැලකේ.

## 2.1.8 අභිචාර විධි


ගල් යුගයේ පැවති අභිචාර විධි ගැන යම් තරමකට හෝ පැහැදිලි තොරතුරක් ලැබෙන්නේ ඒ කාලයට අයත් මිනී වැළලීම් සම්බන්ධයෙනි. වැඩි ආයාසයක් යෙදීමෙන් එවැනි කටයුත්තකට දැරූ උත්සාහයක් පිළිබිඹු වන පැහැදිලි අවස්ථාවක් බඳුල්ලට නුදුරු රාවණාඇල්ල ගල්ගුහාවෙන් සොයා ගෙන තිබේ. දෙකට බෙදෙන සේ සිදුරු විදින ලද මිනිස් හිස් කබලක් එහි කළ කැණීමක දී මතු විය. එම හිස් කබලේ රළුවට පිහිටා තිබුණු දාර සහ පිටතට නෙරා තිබෙන කොටස් ගලක උලා මට්ටම් කර එක් පැත්තක රතු පැහැති ගුරුගල් ආලේප කර තිබේ. රතු පැහැති ගුරුගල් ආලේප කරන ලද මිනිස් ඇටසැකිලිවලට අයත් කොටස් පාහියන්ගල ගල්ගුහාවෙන් ද සොයා ගැනිණි. මළසිරුර එහි කොටස් දිරා යන තුරු යම් තැනක වළලා දමා පසුව ඇටසැකිලි ගොඩ ගෙන නැවත ඒවා තැන්පත් කළ බව මෙවැනි සාක්ෂිවලින් පැහැදිලි වේ. කුරුවිට බටදොඹලෙනෙන් සොයා ගත් ඇටසැකිලි නමා වකුටු කර වළලා තිබිණි. ශ්‍රී ලංකාවේ ගල්යුගයේ ජීවත් වූ මිනිසුන් සහ වර්තමාන වැදි ජනතාව අතර සංස්කෘතිකමය වශයෙන් සහ



*ඡායාරූපය අංක 2.5 සබරගමුව පළාතට අයත් රත්නපුර දිස්ත්‍රික්කයේ කොළඹගෙආර රංචාමඩම රජයේ විද්‍යාල භූමියේ පිහිටි පූර්වඓතිහාසික යුගයේ සොහොන් බිමක්. 2007 වර්ෂයේ දී කැණීම් කොට මතුකරන ලද මෙම සුසාන භූමිය මීට වසර 3350 කට ඉහත කාලයක දී භාවිතයට ගෙන තිබේ.*



නොමිලේ බෙදා හැරීම සඳහා ය.




*සිතියම අංක 2.2 ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයට අයත් යැයි සැලකෙන මහාශිලා සම්ප්‍රදායට අයත් සුසාන භූමිවල ව්‍යාප්තිය.*

ජීවවිද්‍යාත්මක වශයෙන් සමානතා රැසක් තිබෙන බව පර්යේෂකයින් විසින් පෙන්වා දී ඇත.

**ක්‍රියාකාරකම 1**

දැනට සොයාගෙන ඇති ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තිය සිතියමක ලකුණු කර නම් කරන්න.

## 2.2 පූර්ව ඓතිහාසික යුගයේ ජනාවාස

ප්‍රාග් ඓතිහාසික යුගයේ අවසානයත්, ඓතිහාසික යුගයේ ආරම්භයත් අතර කාලපරිච්ඡේදය හැඳින්වෙන්නේ පූර්ව ඓතිහාසික යුගය යනුවෙනි. තාක්ෂණික වශයෙන් මෙය සංක්‍රාන්තික යුගයකි. ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගය ඊට පෙර පැවති ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන් වී පෙනෙන්නේ කරුණු කිහිපයක් පදනම් කොට ගෙන ය. පිළිස්සූ මැටි වළං භාවිතය ආරම්භ කිරීමත් ක්‍රමවත් සුසාන චාරිත්‍ර විධියක් අනුගමනය කිරීමත් යන දෑ ඒ අතරින් ප්‍රධාන ය. ප්‍රාග් ඓතිහාසික යුගයේ දී පැවති ගල් මෙවලම් තාක්ෂණය වෙනුවට යකඩ ලෝහය භාවිත කිරීම මේ කාලයේ දී ඇරඹිණි. එහෙත් ගල් මෙවලම්



*ඡායාරූපය අංක 2.6 පූර්ව ඓතිහාසික යුගයේ දී මියගිය අය වෙනුවෙන් යාතු කර්මික චාරිත්‍ර පැවැත්වීම සඳහා භාවිත කර තිබෙන මෙම මැටි ඔරු සුසානවල ආදාහනය කර තිබෙන්නේ මිනිස් ඇටසැකිලි ය. අනතුරුව භෂ්මාවශේෂ මැටි බඳුන්වල බහා ඒවා තුළ තැන්පත් කර තිබේ. මෙම මැටි ඔරු සුසානය රංචාමඩම පූර්වඓතිහාසික සුසාන භූමියෙන් සොයාගන්නා ලද්දකි.*

භාවිත කිරීම මුළුමනින් ම අතහැර දැමීම සිදු වූයේ පූර්ව ඓතිහාසික යුගයේ අවසන් භාගයේ දී ය. යකඩ භාවිතය ආරම්භ වීම නිසා මෙම යුගය පූර්ව ඓතිහාසික යකඩ යුගය යනුවෙන් ද මුල් යකඩ යුගය යනුවෙන් ද හැඳින්වේ. එලෙසම ස්ථිර ජනාවාස ඉදි කිරීම, කෘෂි කර්මාන්තය ඇරඹීම මෙකල දක්නට ලැබෙන තවත් පරිවර්තනයන් ය.

### 2.2.1 පූර්ව ඓතිහාසික යුගයේ බිහිවීම

ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයේ ආරම්භයත් ප්‍රාග් ඓතිහාසික යුගයේ අවසානයත් අතර සංක්‍රාන්තික සමය ගැන දැනට අපට තිබෙන දැනුම සීමිතය. ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ගල් මෙවලම් තාක්ෂණය සහ දඩයම ඇතුළුව ආහාර එකතු කිරීමේ යැපීම් ක්‍රමය යටපත් වෙමින් ඒ වෙනුවට



*සිතුවම අංක 2.3 මැටියෙන් සාදන ලද ඔරු සුසානවල භෂ්මාවශේෂ සහිත මැටි බඳුන් තැන්පත් කර තිබේ. එය ඉතා පුරාණ කාලයක මෙරට වැසියන් අනුගමනය කළ මළවුන් සඳහා වෙන් වූ යාතු කර්මයකි.*



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ශාක ආහාර මත වැඩි වශයෙන් පදනම් වීම සහ ලෝහ භාවිතයට නැඹුරු වීම යන දෑ හිටිවන ම සිදු විය හැකි පරිවර්තනයක් නොවේ. අනෙක් අතට එවැනි පරිවර්තනයක් ජනනය කිරීමට කිසියම් ප්‍රබල හේතුවක් තිබීම අවශ්‍ය ය. වෙනත් රටවල සිදු වී තිබෙන එවැනි සංස්කෘතික පරිවර්තනවලට බොහෝ අවස්ථාවල බලපා තිබෙන්නේ දීර්ඝ කාලීනව බලපවත්වන පරිදි ඇති වූ දේශගුණික විපර්යාස යි. හොලෝසීන යුගය නමින් හැඳින්වෙන මෑත භූ අවධියේ මැද භාගයේ දී එනම් ක්‍රිස්තු පූර්ව 70004500 අතර කාලවකවානුවේ දී සමස්ත දකුණු ආසියානු කලාපයට ම බලපෑමක් ඇති කළ දේශගුණික විපර්යාසයක් ගැන පුරාවිද්‍යාඥයින් සහ පුරාණ දේශගුණය පිළිබඳ විශේෂඥයින් විසින් කරුණු අනාවරණය කොට තිබේ. එනම්, අයිස් යුගය අවසන් වීමත් සමග ලෝකය උණුසුම් වීම මඟින් කෘෂි කර්මාන්තය සඳහා වඩාත් සුදුසු පරිසර තත්ත්වයක් ගොඩනැගෙන්නට විය. එමෙන් ම ජනගහනය කැපී පෙනෙන අයුරින් වර්ධනය වූ අතර ඒ තුළින් නව සමාජ රටාවක් කෙරෙහි යොමු වීම සිදු විය. ඇතැම් විටෙක ඉදිරි කාලයේ දී සිදු කිරීමට නියමිත පර්යේෂණ කටයුතුවල දී එම දේශගුණික වෙනස් වීම එකල මෙරටේ ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික ප්‍රජාවට බලපෑමක් ඇති කළේ කෙලෙසක ද යන්න පිළිබඳ හෙළිදරව් කරනු ඇත.

ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගය පිළිබඳ පැරණිතම සාධක අයත් වන්නේ ක්‍රිස්තු පූර්ව 2400 ට ය. දැනට කර තිබෙන පුරාවිද්‍යාත්මක ගවේෂණවලට අනුව මෙම යුගයට අයත් සාක්ෂි වඩාත් පැහැදිලිව අනාවරණය වී තිබෙන්නේ සබරගමු පළාතේ ඊසානදිග කොටසින් සහ ඌව පළාතේ නිරිතදිග කොටසින් ය. ඉදිරි කාලයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ගවේෂණවල දී තවත් ප්‍රදේශවලින් මේ පිළිබඳව තවදුරටත් සාක්ෂි අනාවරණය වීමට ඉඩ තිබේ.

ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයට අයත් දිවයිනේ තැන් 50 කට වැඩි ප්‍රමාණයකින් සොයා ගෙන තිබෙන මහාශිලා සුසාන (Megalithic burials) සහ ඒවාට තදනුබද්ධව පිහිටා ඇති පැරණි ජනාවාස මඟින් යැයි පුරාවිද්‍යාඥයෝ විශ්වාස කළහ. විශාල ගල්පතුරු එක්තැන් කොට චතුරස්‍රාකාර හැඩයකට සකසන ලද එකී සුසාන විශාල ගල් පුවරුවකින් ආවරණය කර තිබේ. මිනිස් භස්මාවශේෂ සහිත වළං එම සුසාන ගර්භය තුළ තැන්පත් කර තිබේ. මේවා හැඳින්වීම සඳහා ශිලා මංජුසා සොහොන් (Cist burials) යන ව්‍යවහාරය ද යෙදේ. එවැනි සොහොන් අතරින් මධ්‍යම පළාතට අයත් දඹුල්ලට නුදුරුව පිහිටි ඉබ්බන්කටුව මහාශිලා සුසානයත් යාපහුවේ පිහිටි ගල්සොහොන් කනත්ත නමින් හැඳින්වෙන සුසාන භූමියත්, ගලේවෙලට නුදුරුව පිහිටි යටිගල්පොත්තේ සුසාන භූමියත් දැනට කැණීම් කොට තිබේ. ඒවාට ලැබී තිබෙන විද්‍යාත්මක දින නිර්ණ ක්‍රිස්තු පූර්ව 750  450 ත් අතර කාලයකට අයත් වේ. මෙම ක්‍රමයට අමතර ව මහාශිලා සම්ප්‍රදායට ම අයත් තවත් සුසාන ක්‍රම කිහිපයක් පිළිබඳ සාධක ශ්‍රී ලංකාවෙන් හමු වේ. මේ අතරින් ඇතැම් ඒවා සාමාන්‍ය මැටි බඳුනක භෂ්මාවශේෂ තැන්පත් කොට පොළවේ වළලා තිබේ. එවැනි සොහොන් හැඳින්වීමට භාවිත කරන්නේ *කුම්භීය නිඛනන* (Urn burials) යන පදය යි. එහෙත් ඒවා කිසිවක් කුමන කාලයකට අයත් දැ යි නිශ්චිතව සොයා බලා නැත.


ඌව පළාතේ හල්දුම්මුල්ල සහ බෙරගල පිහිටි පූර්ව ඓතිහාසික යුගයට අයත් සුසානභූමි දෙකක පුරාවිද්‍යාත්මක කැණීම් සිදු කොට තිබේ. මෙම සුසානභූමිවල භස්මාවශේෂ තැන්පත් කොට ඇත්තේ අමු මැටිවෙන් සකසන ලද ඔරුවක හැඩැති බේසමක භස්මාවශේෂ බහා ලූ මැටි වළං තැන්පත් කිරීම එහි දී අනුගමනය කර ඇති ක්‍රමය යි. භස්මාවශේෂ තැන්පත් කරන්නට මත්තෙන් මෙම මැටිඔරු තුළ මිනිස් ඇටසැකිලි ආදාහනය කර තිබේ. එහි දී ගින්නට හසුවීම නිසා අමුමැටිවෙන් තනන ලද ඔරු මැ  නවින් පිළිස්සී තිබේ. ඒවා දීර්ඝ කාලයක් තිස්සේ නොනැසී පවතින්නට බල පෑ හේතුව ද එය යි.

**2.2.2 කාලනිර්ණය**

දැනට කැණීම් කර තිබෙන්නේ එවැනි සුසාන භූමි තුනක් සහ නේවාසික ස්ථාන දෙකක් පමණි. ඒ අනුව ස්ථිර කොට තිබෙන දින මෙසේ ය.

| | |
|---|---|
| *බෙරගල සුසාන භූමිය* | *ක්‍රිස්තු පූර්ව 2400* |
| *හල්දුම්මුල්ල සුසාන භූමිය* | *ක්‍රිස්තු පූර්ව 1750* |
| *රංචාමඩම සුසාන භූමිය* | *ක්‍රිස්තු පූර්ව 1350* |
| *උඩරංචාමඩම නේවාසික ස්ථානය* | *ක්‍රිස්තු පූර්ව 1129* |

කාලනිර්ණය අතින් මැටිඔරු සුසාන වඩා පැරණි ය. එපමණක් නොව ශිලා මංජුසා සුසානවලින් සොයා ගෙන තිබෙන ආනයනිත පබළු ආදි දේ සමග සසඳන විට මැටිඔරු සුසානවලින් සොයා ගෙන තිබෙන දෑ





*සැලසුම අංක 2.1 රත්නපුර දිස්ත්‍රික්කයට අයත් කොළඹගෙආර පිහිටි උඩරංචාමඩම නම් ගම්මානයේ තැනක තිබී කැණීම් කොට මතු කරන ලද පැරණි වරිච්චි නිවාසයක අත්තිවාරමක්. මෙය ක්‍රිස්තු පූර්ව 1129 දී ඉදි කරන ලද්දක් බව විද්‍යාත්මකව තහවුරු කර තිබේ.*

තාක්ෂණය අතින් ප්‍රාථමික වනවා පමණක් නොව විවිධතාව අතින් ද දුර්වල ය. මැටිඔරු සුසානවලින් සැලකිය යුතු තරමේ ගල් මෙවලම් ප්‍රමාණයක් ලැබේ. ශිලා මංජුසා සොහොන්වලින් ගල් මෙවලම් සොයා ගත් අවස්ථා විරල ය. ගල් මෙවලම් බහුලව තැන්පත් කර තිබීම මැටිඔරු සුසානවල පැරණි බව ස්ථිර කරන ප්‍රබල සාක්ෂියකි.

ඌව පළාතෙන් සහ සබරගමු පළාතෙන් සොයා ගත් මැටිඔරු සුසානවලට සමානකම් ඇති සුසාන භූමි දෙකක් රුවන්වැල්ලේ නිකවලමුල්ල සහ අත්තනගල්ලේ කළඹටුවාව යන තැන් දෙකෙන් ද සොයා ගෙන තිබේ. එහෙත් ඒවා අයත් වන්නේ ශිලා මංජුසා සොහොන් අයත් කාලපරිච්ඡේදයට ය. මේ අනුව ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයේ ඈත සීමාව ක්‍රිස්තු පූර්ව 2400 ට අයත් කළ හැකි ය. එහි පහළ මට්ටම ක්‍රිස්තු පූර්ව 600 දක්වා පැමිණෙන බව රංචාමඩම සුසාන භූමියට ලැබුණු එක් දිනයකින් පෙන්නුම් කරයි.

### 2.2.3 ජනාවාසවල ස්වභාවය

ප්‍රාග් ඓතිහාසික යුගයේ ගත කළ දඩයම් ජීවිකාව අවසන් කර ස්ථිර ජනාවාස හා වාසස්ථාන ගොඩනගා ගැනීම මේ යුගය තුළ සිදු වූ වැදගත් ලක්ෂණයකි. ස්ථිරවාසීතාව (sedentism) යනුවෙන් හැඳින්වෙන මෙම ලක්ෂණය පිළිබිඹු කරන ප්‍රධාන සාක්ෂිය නම් ඒ යුගයට අයත් දැනට සොයා ගෙන තිබෙන නිවාස අවශේෂ යි. 2009 වසරේදී එවැනි නිවාසයක් රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි උඩරංචාමඩම නමින් හැඳින්වෙන ගම්මානයෙන් සොයා ගැනීමට පුරාවිද්‍යාඥයෝ සමත් වූහ. එම නිවාසය මීටර 10.20 x 6.80 ප්‍රමාණයෙන් සහ ආයත චතුරස්‍රාකාර හැඩයෙන් යුක්ත වූව කි. එහි ඉදිරිපස සහ පසුපස කොටස් බිත්තියකින් වෙන් කර තිබිණි. නිවසේ බිත්ති වරිච්චි මැටියෙන් ඉදි කොට තිබූ අතර වහල ඉලුක් හෝ එවැනි දෙයකින් සෙවිලි කොට තිබෙන්නට ඇත.



*සිතුවම 2.4 අංක ක්‍රිස්තු පූර්ව 1129 දී උඩරංචාමඩමේ ඉදිකර තිබූ නිවාසය දැක්වෙන චිත්‍රයක්. මෙය කැණීමෙන් මතුකර ගන්නා ලද අත්තිවාරමේ සැලැස්ම අනුව නිර්මාණය කරන ලද්දකි.*

## 2.2.4 ජීවන රටාව

ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයට අයත් ජීවන රටාව කෙබඳු ස්වරූපයකින් යුක්ත වූවක් දැ යි සම්පූර්ණව වටහා ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි තවමත් ලැබී නැත. දැනට වැඩි වශයෙන් කැණීම් කර තිබෙන්නේ සුසානභූමි වන බැවින් ඒවායින් සොයා ගත හැකි ඒ කාලයේ සාමාන්‍ය ජනජීවිතයට අයත් සාක්ෂි සීමිත ය. මේ පිළිබඳව යම් තරමකින් හෝ අදහසක් ලබා ගැනීමට ඉවහල් වන්නේ උඩරංචාමඩමේ නේවාසික ස්ථානයේ කළ කැණීමෙන් ලද තොරතුරු ය.

උඩරංචාමඩමේ දී කණින ලද්දේ මීට අවුරුදු 3129 ට ඉහත කාලයක දී ඉදි කරන ලද නිවාසයකි. එහි ඇතුළත තිබී පැරණි වළංකටු රාශියක් සොයා ගැනිණි. ඒවා අතර පින්තාරු කළ වළඳකට අයත් කැබලි ගණනාවක් ද විය. සුදු පැහැති පසුබිමක රතු පැහැයෙන් ඉරි යොදා එම වළඳේ පිටපැත්ත සහ අඩියේ යට පැත්ත අලංකාර කර තිබේ. ඉරි යොදා තිබෙන සමමිතික ආකාරය අනුව එම වළඳ සකපෝරුව භාවිත කොට තනන ලද්දක් බව ස්ථිර ය. මෙවැනි ම තවත් වළඳක කොටස් හල්දුම්මුල්ලේ නේවාසික ස්ථානයක් කැණීමෙන් ද සොයා ගැනිණි.


කැණීමට ලක් කළ නිවාසයේ මුළුතැන්ගෙයි මෙවලම් කිහිපයක් තිබිණි. ඒ අතර ගල් මෙවලම් සහ යකඩ මෙවලම් ද විය. ඒ භාණ්ඩ එකතුවේ වැඩි ප්‍රමාණයක් ගල් මෙවලම් තිබීමෙන් පෙනී යන්නේ යකඩ භාවිතය ඒ වන විටත් ඔවුන්ට නව අත්දැකීමක්ව තිබූ බව යි. මුළුතැන්ගෙයි තිබූ වෙනත් සුන්බුන් අතර එම නිවාසයේ වාසය කළ පුද්ගලයින් ආහාරය සඳහා දඩයම් කරන ලද සතුන්ගේ ඇටකටු ද ඉතිරි වී තිබිණි. මේ ඇටකටු මුවා, ගවයා, වල්ඌරා සහ දඬුලේනා යන සතුන්ට අයත් ඒවා යි. මෙම සාක්ෂි මගින් පෙන්වා දෙන්නේ කෘෂිකාර්මික දිවිපෙවෙතකට හුරු වුව ද සතුන් දඩයම් කිරීම ඔවුන් විසින් සම්පූර්ණයෙන් ම අත් හැර නොදැමූ බව ය.

නිවස තුළ තිබී සොයා ගන්නා ලද දේ අතරට මැටි පබළු කිහිපයක්, කාන්තාවන් ඇස් අඳුන් තැබීමට භාවිත කරන ලෝහ කූරක් සහ සිරුර වර්ණ



*නොමිලේ බෙදා හැරීම සඳහා ය.*





*ඡායාරූපය අංක 2.7 ක්‍රිස්තු පූර්ව 1129 ට දින නිර්ණය වී තිබෙන උඩරංචාමඩමේ පැරණි නිවාසයෙන් සොයාගන්නා ලද පින්තාරු කළ මැටි බඳුන. ඉතා පැරණි කාලයක සිට වළං සෑදීමේ තාක්ෂණය ශ්‍රී ලංකාවේ පැවති බව මෙම නිදර්ශනය මගින් මැනවින් තහවුරු කරයි. ඡායාරූපයේ දකුණු පස දැක්වෙන්නේ එම මැටි බඳුන මුල් අවස්ථාවේ පැවති ආකාරය දැක්වෙන චිත්‍රයකි.*

ගැන්වීම සඳහා භාවිත කරන කහ සහ රතු පැහැති ගුරුගල් දෙකක් ද ඒවා උරච්චි කිරීමට යොදා ගත් ඇඹරුම් ගල් දෙකක් ද ඇතුළත් ය. මෙම සාක්ෂි මගින් පෙනෙන්නේ එකල විසූ කාන්තාවන් තමන්ගේ රූ සපුව අලංකාර කර ගැනීමට මහත් උනන්දුවක් දක්වා ඇති බවයි.

### 2.2.5 තාක්ෂණය

ප්‍රාග් ඓතිහාසික අවධියේ පැවති ගල් ආයුධ තාක්ෂණයෙන් කෙමෙන් මිදී ලෝහ තාක්ෂණය හා මැටි බඳුන් නිපදවීමේ තාක්ෂණය වෙත පරිවර්තනය වීම ඇරඹුණේ පූර්ව ඓතිහාසික යුගය නමින් හැඳින්වෙන කාලපරිච්ඡේදයේ දී ය. ලෝහයක් ලෙස යකඩ භාවිත කිරීම ආරම්භ වූ නිසා මේ යුගයේ වැසියන්ට වඩාත් කාර්යක්ෂම ලෙස තමන්ගේ එදිනෙදා වැඩකටයුතු කර ගැනීමේ අවස්ථාව උදා විය. යකඩ ශක්තිමත් ලෝහයක් නිසා කැලෑ එළිපෙහෙළි කිරීම, පොළව කෙටීම සහ සී සෑම ආදී කටයුතුවල දී එම කටයුතු පහසු විය. උඩරංචාමඩමේ පැරණි නිවාසයෙන් සොයා ගන්නා ලද පින්තාරු කරන ලද මැටිබඳුන ඒ කාලයේ පැවති මැටිභාණ්ඩ නිපදවීමේ තාක්ෂණයේ උසස් තාක්ෂණික ප්‍රමිතියේ ස්වරූපය පෙන්වා දෙයි. නිවාස ඉදි කිරීම ආරම්භ වූ හෙයින් ඊට අදාළ තාක්ෂණික දැනුම ක්‍රමයෙන් වර්ධනය විය. විශේෂයෙන් ම ගිලා නොබසින ලෙස ගෙබිම සකස් කර ගැනීම, පොළවට ලම්බාකාර වන ලෙස බිත්ති ඉදි කිරීම ආදී දේ ඊට අයත් ය. උඩරංචාමඩම නිවාසයේ කැණීම් කටයුතුවල දී මැටි පබළුවක් සොයා ගෙන තිබේ. එමගින් පෙන්නුම් කරන්නේ පබළු නිපදවීමේ තාක්ෂණය ඒ යුගයේ පැවති බවයි. පබළුවක් නිපදවීමට ඉතා සූක්ෂම තාක්ෂණයක් අවශ්‍ය ය.

**ක්‍රියාකාරකම 2**

**ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයෙහි ජනාවාස ව්‍යාප්තිය සිතියමක ලකුණු කර නම් කරන්න.**

## 2.3 මුල් ඓතිහාසික යුගයේ ජනාවාස

ශ්‍රී ලංකාවේ ඓතිහාසික යුගයට අයත් මුල් අවධියේ ජනාවාස පිළිබඳව විස්තර කරන ප්‍රවෘත්ති ඓතිහාසික මූලාශ්‍රයවල සඳහන්ව තිබේ. එලෙස විස්තර වන ජනාවාස පිහිටි තැන් නිශ්චිතව හඳුනා ගැනීමට එම තොරතුරු ප්‍රමාණවත් නොවන මුත් එකී ජනාවාසවල ස්වරූපය කෙබඳු දැ යි වටහා ගැනීමට ඉන් සැලකිය යුතු පිටිවහලක් ලැබේ. මෙරට පුරාණ ජනාවාසවල ව්‍යාප්තිය සහ ඒවාට අදාළ වෙනත් තොරතුරු ගැන යම් තරමක හෝ නිශ්චිතතාවකින් යුතුව වටහා ගැනීමට ඉවහල් වන්නේ පුරාවිද්‍යාත්මක සාක්ෂි ය.

මුල් ඓතිහාසික යුගය වශයෙන් සැලකෙන්නේ ක්‍රිස්තු පූර්ව 450 පමණ සිට ක්‍රිස්තු වර්ෂයෙන් 300 වන තුරු කාලපරිච්ඡේදය යි. මෙම කාලපරිච්ඡේදය තුළ මෙරට තිබූ ජනාවාස ව්‍යාප්තව පැවතියේ කිනම් ප්‍රදේශවල දැ යි පෙන්නුම් කරන ප්‍රධාන දර්ශකය නම් කුඩා ගම්වැව්වල ව්‍යාප්තිය යි. නටබුන්ව ගිය එවැනි කුඩා ගම්වැව් දහස් ගණනක් ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්තව තිබේ. ඓතිහාසික යුගයේ ජනාවාස බහුතරය වැවක් කේන්ද්‍ර කොට ගනිමින්



නොමිලේ බෙදා හැරීම සඳහා ය.



*ඡායාරූපය අංක 2.8 අනුරාධපුර පැරණි ඇතුළු නුවර සිදුකරන ලද කැණීමකින් සොයාගන්නා ලද ආයත චතුරස්‍රාකාර බිම්සැලැස්මකින් යුත් පැල්පතකට අයත්ව තිබූ කණුවළවල් කිහිපයක් (ඡායාරූපය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කාරුණික අනුග්‍රහයෙනි).*

එහි ආසන්නයේ ම පැවතිණි. වැව් බැම්මේ එක් කෙළවරක වැවට නුදුරුව එවැනි ගම් පිහිටා තිබූ බව පුරාවිද්‍යාත්මක ක්ෂේත්‍ර ගවේෂණවලින් සොයා ගෙන තිබේ.

## 2.3.1 ජනාවාස ව්‍යාප්තියට බල පෑ ප්‍රධාන සාධක

පුරාණ ජනාවාස ව්‍යාප්තියට බලපෑ ප්‍රධාන සාධකයක් වූයේ භූ භෞතික පසුබිම යි. වාර්ෂික වර්ෂාපතන අගය, පසේ ස්වභාවය, භූ විෂමතාව, ස්වභාවික සම්පත්වල ව්‍යාප්තිය, ජලවහනය ආදිය මේ අතර ප්‍රධාන ය.

මුල් ඓතිහාසික යුගයේ දී ජනාවාස ව්‍යාප්ත වූයේ ශ්‍රී ලංකාවේ වියළි දේශගුණයක් ඇති ප්‍රදේශවල ය. වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර 10001250 ක් ලැබෙන ප්‍රදේශ වියළි කලාපය ලෙසත්, මිලිමීටර 1000 අඩු ප්‍රදේශ ශුෂ්ක කලාපය ලෙසත් සැලකේ. කෘෂිකර්මය සඳහා අවශ්‍ය කරන ජලය ප්‍රමාණවත් තරමින් වර්ෂය පුරා ලබා ගැනීම දුෂ්කර වුවත් මූලික ජනාවාස වියළි කලාපයේ ව්‍යාප්ත වූයේ එහි පසේ තිබෙන සාරවත් බව නිසා ය. රතුදුඹුරු පස යනුවෙන් හැඳින්වෙන වියළි කලාපයේ වැඩි ප්‍රදේශයක් පැතිරී ඇති පස කෘෂිකර්මයට ඉතා ම සුදුසු වූවකි. මෙම ප්‍රදේශවලට කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය කරන ජලය ලැබෙන මාර්ග දෙකක් තිබිණි. ඉන්

ප්‍රධාන වූයේ මෝසම් වර්ෂාව යි. ස්වාභාවික ගංගා මඟින් ලැබෙන ජලය ද වියළි කාලවල දී යම් තරමකට ප්‍රයෝජනවත් විය. එහෙත් ගංගා ජලය කෘෂිකාර්මික කටයුතුවලට යොදා ගැනීමේ දී ගංගා හරහා අමුණු බැඳීම රැස් කර ගත් ජලය අවශ්‍ය තැන්වලට ගෙන යාම සඳහා ඇළ මාර්ග තැනීම ආදි දේ කිරීමට සිදු විය. එය ශ්‍රමය කාලය හා තාක්ෂණය යෙදවිය යුතු ක්‍රියාවක් නිසා වැඩි නැඹුරුවක් දැක්වූයේ වැව් තැනීමෙන් ජලය රැස් කර ගැනීම සඳහා යි.



*ඡායාරූපය අංක 2.9 අනුරාධපුර පැරණි ඇතුළු නුවර සිදුකරන ලද කැණීමකින් සොයාගන්නා ලද වටකුරු බිම්සැලැස්මකින් යුත් පැල්පතකට අයත්ව තිබූ කණුවලවල් කිහිපයක් (ඡායාරූපය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කාරුණික අනුග්‍රහයෙනි).*

මුල් ඓතිහාසික යුගයට අයත් ජනාවාස වර්ධනය වූ ආකාරය පිළිබඳව සිදු කර තිබෙන විස්තරාත්මක අධ්‍යයනවල ප්‍රතිඵල මඟින් පෙන්නුම් කරන්නේ මෙරට ඓතිහාසික යුගයේ මුලික ජනාවාස පැතිරෙන්නේ ගංගා නිම්නවල නොව ඊට පිටතින් පිහිටි ප්‍රදේශවල බව යි. මීට බලපෑ ප්‍රධාන හේතුව වන්නට ඇත්තේ ගංගා මඟින් වාර්ෂිකව ගෙනෙන විනාශකාරී ගංවතුර පාලනය කිරීමට සරිලන තාක්ෂණයක් ඒ වන විට නිපදවා නොමැති වීම ය. ගංගා හරස් කොට අමුණු බැඳ ජලය වැව් කරා ගෙන යාමෙන් ගංවතුර පාලනය කිරීම ආරම්භ වූයේ ක්‍රිස්තු පූර්ව පළමුවන සියවසේ අගභාගයේ දී හෝ ක්‍රිස්තු වර්ෂයෙන් පළමුවන සියවසේ දී විය යුතු ය. තිස්සමහාරාම වැව ඉදි කළ ඉළනාග රජු (ක්‍රි.ව 3343) සමයේ කිරිඳිඔය හරස් කොට අමුණක් බැඳ තිබේ. කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි ගනේකන්ද විහාරයේ සහ ගල්ලෙන විහාරයේ තිබෙන ගල්ගුහා දෙකක කොටා ඇති බ්‍රාහ්මී සෙල්ලිපිවල ‘අවරණ’ යන වචනය දැක්වේ. එහි අදහස ‘අමුණ’ යන්න යි.

## 2.3.2 ජනාවාස ව්‍යුහය හා ස්වරූපය

වැසි ජලයෙන් පෝෂණය වන කුඩා වැව් කේන්ද්‍ර කර ගනිමින් ගංගාවල පිටාර නිම්නයට පිටතින් වූ ප්‍රදේශවල ව්‍යාප්ත වූ ජනාවාස එකිනෙකින් ස්වාධීන වූ ඒවා යි. වැවක් කේන්ද්‍ර කොට ගෙන වර්ධනය වූ එවැනි ජනාවාස වාපිගාම යනුවෙන් සාහිත්‍ය මූලාශ්‍රයවල හඳුන්වා දී තිබේ. මහාවංසයේ සඳහන් සුමනවාපිගාම, විහාරවාපිගාම, හුන්දරිවාපිගාම, කඩහවාපිගාම යන ගම් එවැනි වැව් ගම් ය.

එක් ගමක් තවත් ගමකින් වෙන් වූයේ කැලෑ තීරයකිනි. වැව්ගම්වලට අමතරව මෙසේ එකිනෙකින් ස්වාධීන වූ ගම් පිළිබඳව ඓතිහාසික මූලාශ්‍රයවල කෙටි සඳහන් කිරීම් ඇතුළත්ව තිබේ. නොයෙකුත් වෘත්තිකයින් විසූ ඇතැම් ජනාවාස වංසකථාවල සහ සෙල්ලිපිවල සඳහන් කොට තිබෙන්නේ මෙසේ යි.

*1 කසීකාරගාම — ගොවියන් විසූ ගම්*

*2 මණිකාරගාම — මැණික් ගැරූ හෝ මැණික් කැපූ අය ජීවත් වූ ගම්*

*3 ගෝපාලගාම — ගොපල්ලන් විසූ ගම්*

*4 කේවට්ටගාම — ධීවරයින් විසූ ගම්*

*5 කුම්භකාරගාම — වළං සාදන්නන් විසූ ගම්*

*6 වඩ්ඪකීගාම — වඩුවන් විසූ ගම්*


මේ හැරුණු විට කාර්යය පදනම් කොට ගෙන ක්‍රියාත්මක වූ තවත් ගම් වර්ග කිහිපයක් තිබිණි.

*7 පට්ඨානගාම — වරාය ආශ්‍රිතව තිබූ ගම්*


*8 නියම්ගම් — වෙළෙඳ ගම්*

*9 ඔළගම් — ජනතාව විසින් අතහැර දැමූ වැව්ගම්*


පැරණි ජනාවාසවල විශාලත්වය කෙතෙක් වී දැ යි යන කාරණය පිළිබඳව ස්ථිර නිගමනයකට පැමිණීම අපහසු ය. එය විවිධ භූගෝලීය ප්‍රදේශවල පැවති




*සිතියම අංක 2.3 මෙම සිතියමේ දක්වෙන්නේ ශ්‍රී ලංකාවේ පැරණිතම ගම්වැව්වල ව්‍යාප්තිය යි. ගම සහ වැව අතර සමීප සබඳතාවක් පැවති බැවින් වැව්වල ව්‍යාප්තිය පැරණි ජනාවාසවල ව්‍යාප්තිය පිළිබිඹු කරයි*




*සිතියම අංක 2.4 හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් තිස්සමහාරාමය අසලින් ගලා ගෙන යන කිරිඳිඔය ආශ්‍රිත ප්‍රදේශයේ පැරණි ජනාවාස ව්‍යාප්තිය දැක්වෙන සිතියමක්. (සිතියමේ තිත්වලින් ජනාවාස දැක්වේ.) මෙහි ගංගාවේ නිම්නයට ඇතින් තිබෙන ජනාවාස ක්‍රිස්තු පූර්ව 900500 ත් අතර කාලයට අයත් වේ. එම ජනාවාස එම ගංගාවට අදාළ ප්‍රදේශයේ මුලින් ම බිහි වූ ඒවා යි. ගංගාව ආශ්‍රිතව පිහිටා ඇති ප්‍රදේශයේ ජනාවාස පැතිරී තිබෙන්නේ කිරිඳිඔයේ වාර්ෂික ගංවතුර පාලනය කිරීමට උපාය මාර්ග යෙදීමෙන් පසුව ය.*



*සිතුවම අංක 2.5 මෙම චිත්‍රයෙන් දක්වෙන්නේ ශ්‍රී ලංකාවේ පැරණි ගමක කල්පිත ස්වරූපයකි. ස්වභාවධර්මය සමඟ සුහදශීලීව ජීවත් වීමත් ඒ නිසා ම තම ජීවන රටාව තුළ ඇති වූ සරල බවත් ග්‍රාමීය ජීවිතය තුළ කැපී පෙනෙන ලක්ෂණ ය.*

ස්වභාවික සම්පත්වල සුලබතාව මත පදනම් විය. එහෙත් දැනට සිදුකර තිබෙන පුරාවිද්‍යාත්මක විමර්ශනවලින් ලැබී තිබෙන සාක්ෂි අනුව කුඩා ප්‍රමාණයේ ගමක විශාලත්වය සාමාන්‍යයෙන් හෙක්ටයාර 0.15 කට වඩා වැඩි නොවී ය. මධ්‍යම ප්‍රමාණයේ ග්‍රාමීය ජනාවාසයක් හෙක්ටයාර 2 ක ප්‍රමාණයක් වූ අතර විශාල නාගරික ජනාවාසයක් හෙක්ටයාර 2 කට වඩා විශාල විය.

සාමාන්‍යයෙන් ගමක පවුල් 56 ත් අතර ප්‍රමාණයක් වාසය කළේ ය. ඇතැම් විශාල ප්‍රමාණයේ ගම්වල පවුල් 30 ක් විසූ බව සාහිත්‍ය මූලාශ්‍රයවල දැක්වේ. නාගරික ජනාවාසවල මේ තත්ත්වය ඉඳුරා ම වෙනස් විය. ක්‍රිස්තු වර්ෂයෙන් හයවන සියවස වන විට පැරණි මාගම නගරයේ සහ ඊට තදනුබද්ධ නාගරික ජනාවාසවල අවම තරමින් 35 000 ක ජනගහනයක් විසූ බවට දළ වශයෙන් ගණනය කර තිබේ. ඇතැම් ගම් වැටකින් ආරක්ෂා කර තිබූ බවට සාහිත්‍ය මූලාශ්‍රයවල දැක්වේ. එවැනි ගම් හැඳින්වූයේ 'පරික්ඛිත්ත ගම්' යනුවෙනි. එවැනි ආරක්ෂාවක් නොමැති ගම් 'අපරික්ඛිත ගම්' යනුවෙන් හැඳින්විණි.

විශාල නාගරික ජනාවාස හැඳින්වීමට 'පුර' යන පදය ව්‍යාවහාර විය. ක්‍රිස්තු පූර්ව 250 තරම් ඈත කාලයක දී රචිත බ්‍රාහ්මී සෙල්ලිපියක 'පුර කමත' යනුවෙන් තනතුරු නාමයක් සඳහන්ව තිබේ. එයින් අදහස් කර තිබෙන්නේ නගරයේ ප්‍රධාන වාස්තු ශිල්පියා යි. පළමුවන විජයබාහු රජතුමාට (ක්‍රි.ව. 10551110) අයත් පනාකඩුව තඹ සන්නසේ අනුරාධපුරය නම් කිරීමට යොදා තිබෙන්නේ 'නුරුපුර' යන ව්‍යවහාරය යි.

'නකර' හෙවත් නගර යනුවෙන් හැඳින්වූ ජනාවාස විශේෂයක් ගැන මෙරට පුරාණතම සෙල්ලිපිවල සඳහන් ය. මෙහි නගර යනුවෙන් හඳුන්වා තිබෙන්නේ ගමත්, පුරයත් අතර වූ ජනාවාසයකි. ගම්වල නිෂ්පාදනය කරන දෑ වෙළෙඳාම පිණිස මහා නගර වෙත ගෙන යාම සම්බන්ධීකරණය වූයේ මෙම අතරමැදි ජනාවාසවලිනි. ඒවා ප්‍රමාණයෙන් ගමකට වඩා මඳක් විශාල වූ ජනාවාස යි.

මුල් ඓතිහාසික යුගයට පෙර සිට ම මෙම



*නොමිලේ බෙදා හැරීම සඳහා ය.*

ජනාවාසවල සංවිධානය සහ පරිපාලනය ක්‍රමවත්ව පැවති බව පෙන්වීමට සාක්ෂි තිබේ. ගමක් යනු පවුල් කිහිපයකින් සැදුම් ලත් ඒකකයකි. පවුල යනු ගමක වැදගත් ම සාධකයකි. පවුලක් නියෝජනය කරන ලද ගෘහපතියා විසිනි. බ්‍රාහ්මී සෙල්ලිපිවල ඔහු හඳුන්වා තිබෙන්නේ 'ගහපති' යනුවෙනි. ගමක ගෘහපතින් කිහිප දෙනෙකුගෙන් සැදුම් ලත් කණ්ඩායමක් වෙනුවෙන් කටයුතු කළ පුද්ගලයා හැඳින්වූයේ 'ගමික' හෙවත් ග්‍රාමික යන නමිනි. එහි තේරුම ගමේ ප්‍රධානියා යන්න යි. පසුකාලයක මෙකී ගම්ප්‍රධානීන් දසදෙනෙකුගෙන් සමන්විත වූ මණ්ඩලයක් මඟින් ගම් කිහිපයකින් සැදුම් ලත් ප්‍රදේශයක පරිපාලනයට සම්බන්ධ ගැටලු විසඳීමෙහි නිරත විය. සෙල්ලිපිවල මෙම මණ්ඩලය හඳුන්වා දී තිබෙන්නේ 'දසගම් ඇත්තන්' යන ව්‍යවහාරයෙනි. මාතලේ දිස්ත්‍රික්කයට අයත් දඹුල්ලේ පිහිටි කළුදියපොකුණ නමින් හැඳින්වෙන පැරණි බෞද්ධ විහාරයේ ඇති එක් සෙල්ලිපියක සඳහන් කර තිබෙන්නේ එම විහාරයේ දානය සපයා ගැනීමේ කටයුතුවල දී යම් ගැටළුවක් ඇති වුව හොත් දසගම් ඇත්තන් රැස් වී එම ගැටළුව විසඳිය යුතු බව යි.

අනුරාධපුරයේ කරන ලද කැණීම්වලින් පැරණි ග්‍රාමීය නිවාස කිහිපයකට අයත්ව තිබූ අත්තිවාරම් හෙළිදරව් විය. ඒවා වරිච්චි බිත්තිවලින් සහ කොළ අතු පියස්සකින් සමන්විත තිබුණු පැල්පත් ය. ඒ අතරින් සමහර ඒවා වටකුරු හැඩයකින් යුක්ත ය. ඇතැම් නිවාස හතරැස් හැඩයේ බිම් සැලැස්මකින් යුක්ත ය. පුරාවිද්‍යාඥයින්ට හමු වී තිබෙන්නේ ඒවා තිබූ තැන්වල ඉතිරිව ඇති කණු වළවල් පමණි. තිස්සමහාරාමයේ වළගම්පත්තුව නමින් හැඳින්වෙන ගමකින් ද පුරාණ නිවාසයකට අයත් සලකුණු සොයා ගැනීමට හැකි විය. එම නිවාසයේ බිම සකස් කර තිබෙන්නේ පොළොව සාරා එහි මතුපිට මැටි ආලේප කිරීමෙනි. එම නිවාසය ක්‍රිස්තු වර්ෂයෙන් තුන්වන සියවසේ දී භාවිත කරන ලද්දක් බව විද්‍යාත්මකව සනාථ කර තිබේ.

පැරණි කාලයේ මෙරට පැවති ජනාවාසවල ස්වභාවය කෙබඳු ද යන කාරණය මෙම පාඩමේ දී ඉගෙන ගැනීමට අවස්ථාවක් ලැබිණි. ඉතා පුරාණ කාලයක සිට සාමූහිකවත් විධිමත් ලෙසත් සිය ජීවිතය හැඩගස්වා ගන්නට ඔවුන් සමත් වූ ආකාරය ඔබට ආදර්ශයක් බව සිතට ගත යුතු ය.

### 2.3.3 යැපීම් ක්‍රමය

ගංගාවක පිටාර නිම්නයෙන් පිටත ප්‍රදේශවල ජනාවාස ව්‍යාප්ත වීමේ දී ඒවායේ ජීවත් වූ වැසියන් සිය යැපීම් ක්‍රමය ලෙස අනුගමනය කළේ හේන්ගොවිතැන යි. කුරක්කන්, මෙනේරි, තල සහ තණහාල් වැනි කටුසර බෝග ඒවායේ වගා කෙරිණ. කෙටි මුල් පද්ධතියක් සහිත නියඟයට හොඳින් ඔරොත්තු දෙන එම බෝග ජලය හිඟ පිටාර නිම්නයෙන් බැහැර ප්‍රදේශවල වගා කිරීමට යෝග්‍ය ය. මූලික ගම්වැව් ඉදි කිරීමට පෙලඹවීමක් ඇති වන්නේ එකී ජනාවාසවල විසූ ජනගහනය පුළුල් වීමට සමාන්තරව ආහාර නිෂ්පාදනය වැඩි කිරීමට සිදු වූ නිසා ය. වැඩියෙන් ගොවිතැන් කිරීමට වැඩිපුර ජලය අවශ්‍ය විය. ගංගා නිම්නවලට පිටතින් ආරම්භ වන මුල්ඓතිහාසික යුගයේ ජනාවාස, ගංගා නිම්නය තුළට අවතීර්ණ වන ආකාරය පිළිබඳ ඉතා පැහැදිලි පිළිබිඹුවක් කිරිඳි ඔය නිම්නයේ සිදු කර තිබෙන පැරණි ජනාවාස අධ්‍යයනයකින් පෙන්වා දී තිබේ. (සිතියම අංක 2.4 බලන්න).

**ක්‍රියාකාරකම් 3**

ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය/ පූර්ව ඓතිහාසික යුගය/ ඓතිහාසික යුගය යන යුගවල ජනාවාසකරණයේ මූලික අංගවල ඇති වෙනස්කම් වෙන් වෙන් වශයෙන් දක්වන්න.

**වැදගත් කරුණු**

1. ශ්‍රී ලංකාව ජනාවාස වූයේ මීට අවුරුදු ලක්ෂ ගණනකට ඉහත දී ය. එලෙස මෙරට මුල් ජනාවාස පිහිටුවා ගන්නා ලද්දේ ආදි කාලීන හෝමෝ සාපියන්වරු විසිනි.

2. ආදි කාලීන හොමෝ සාපියන්වරු මෙරට විවිධ පරිසර කලාපවලට හැඩ ගැසෙමින් ජීවත් වූහ. එහෙයින් ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල ඔවුහු වාසය කළ හ. ඔවුන් කිසිදු වාර්ගික අනන්‍යතාවක් පිළිබිඹු කළේ නැත.

3. ශ්‍රී ලංකාවේ මුල් පදිංචිකරුවන්ගේ සංස්කෘතිය පැවති කාලපරිච්ඡේදය හඳුන්වන්නේ ප්‍රාග් ඓතිහාසික යුගය යන නමිනි. ඒ කාලය තුළ ඔවුන්ගේ ප්‍රධාන ජීවන ක්‍රමය වූයේ දඩයම සහ තැන තැන ඇවිද යමින් ආහාර රැස් කිරීම යි.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

4. ඒ කාලයේ පැවතියේ ගල් මෙවලම් තාක්ෂණය යි. තමන්ගේ එදිනෙදා අවශ්‍යතා සඳහා ඔවුන් තිරිවානා, කහඳ ආදි ගල්වලින් මෙවලම් තනා ගැනීමට පුරුදු වී සිටියහ. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඉතිහාසය හැඳින්වීමට 'මධ්‍ය ශිලා යුගය' යන යෙදුම ද භාවිත වේ.

5. පසු කාලයක මෙරට විසූ ප්‍රාග් ඓතිහාසික මිනිසුන් ගොවිතැනට හුරු වූ බවට සාක්ෂි හමු වී තිබේ. දැනට ලැබී තිබෙන සාධක අනුව එම පරිවර්තනයන් ක්‍රිස්තු පූර්ව 2400 වන විට සම්පූර්ණත්වයකට පත් ව තිබිණි.

6. වළං සෑදීම, සුසාන භූමි භාවිතය සහ යකඩ ලෝහය භාවිත කිරීම පසු කාලයේ දී ආරම්භ විය. මෙම යුගය හැඳින්වෙන්නේ පූර්ව ඓතිහාසික යුගය යන නමිනි.

7. පූර්ව ඓතිහාසික යුගය වැදගත් කාලපරිච්ඡේදයක් වන්නේ ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරික වර්ධනයට අදාළ මූලික ද එම යුගයෙන් ආරම්භ වීම නිසා ය. මෙරට මිනිසුන් ගම්මානවල ජීවත් වීම ආරම්භ කරන ලද්දේ මේ සමයේ දී ය.

8. මහාවංසය සඳහන් කරන ආකාරයට විජය කුමරු ඇතුළු ඔහුගේ පිරිස මෙරටට පැමිණෙන අවධියේ ශ්‍රී ලංකාවේ ඉතා සංවිධානාත්මක සමාජයක් පැවතිණි.

*ඉරණමඩු තැන්පතුව  මහාහිමයුගයේ සිසිල් කාලපරිච්ඡේදවල ශ්‍රී ලංකාවට අධික වර්ෂා සහගත දේශගුණයක් පැවතියේය. මේ කාලයේදී උස් ස්ථාන අධික ලෙස ඛාදනයට  ලක් විය. එසමයේදී කඳුකර ප්‍රදේශවලින් ඛාදනයට ලක් වූ පාෂාණ පහත්බිම්වල තැන්පත් වූයේ ය. මුහුදු වෙරළේ සිට කිලෝමීටර 32ක් දක්වා රට ඇතුළත ප්‍රදේශයේ එලෙස තැන්පත් වූ පස් තීරුවක් දක්නට තිබේ. මෙම පස් තට්ටුව හැඳින්වෙන්නේ ඉරණමඩු තැන්පතුව නමිනි. ඊට ඒ නම භාවිත කිරීමට හේතුව එම පස්තට්ටුව පළමුවරට පැහැදිලිව හඳුනා ගන්නා ලද්දේ ඉරණමඩු වැව ආශ්‍රිත ප්‍රදේශයෙන් වූ නිසා ය. මෙම පස්තට්ටුවේ ප්‍රාග් ඓතිහාසික මිනිසුන් විසින් භාවිත කළ ගල් මෙවලම් අඩංගු ය.*

*ආදි කාලීන හෝමෝ සාපියන්  හෝමෝ සාපියන් යනුවෙන් හැඳින්වෙන්නේ නූතන මිනිස් පවුලයි. මෙම නූතන මිනිස් පවුලේ ආදිතමයින් පහළ වූයේ මීට වසර පන්ලක්ෂයකට පමණ ඉහත කාලයකදී ය. වසර 500 000  200 000 අතර කාලයේ ජීවත් වූ හෝමෝ සාපියන් පවුලේ ආදිතමයින් හැඳින්වීමට ආදි කාලීන හෝමෝ සාපියන් (Archaic Homo sapiens) යන පදය භාවිත කරයි.*

*ක්ෂුද්‍ර ගල් මෙවලම්  ප්‍රාග් ඓතිහාසික යුගයේ මෑත වකවානුවල දී භාවිතයේ පැවති කුඩා ප්‍රමාණයේ ගල්මෙවලම් මේ නමින් හැඳින්වේ. තිරිවානා සහ කහඳ යන පාෂාණවලින් සකස් කර ගෙන තිබෙන ක්ෂුද්‍ර ගල් මෙවලමක් සෙන්ටිමීටර 1 සිට සෙන්ටිමීටර 7 ක් පමණ දක්වා වූ දිගකින් යුක්ත ය. ඉහත සඳහන් කරන ලද වර්ගයේ ගලකින් කඩා ගන්නා ලද පතුරක් මුවහත් මුහුණතක් ඇති වන පරිදි නැවත හැඩ ගස්වා ලී කැබැල්ලක හෝ සතෙකුගේ ඇටකැබැල්ලක රඳවා ගන්නා එවැනි මෙවලමකින් කැපීම, සීරීම, විදීම ආදී දේ කර තිබේ.*

*පිටාර නිම්නය  දැඩි වර්ෂා කාලවල දී ගංගා මගින් ගංවතුර තත්ත්වයක් ඇති කරයි. එවන් අවස්ථාවල ගංගාවේ ඉවුරු දෙපස වූ ගොඩබිම ජලයෙන් යට වේ. ගංගාව දෙපස ගංවතුරට යට වන ප්‍රදේශය එම ගංගාවේ පිටාර නිම්නය ලෙස හැඳින්වේ. ගංවතුර මගින් රැගෙන එන රොන්මඩ පිටාර නිම්නයේ තැන්පත් වේ. එහෙයින් එම ප්‍රදේශය ඉතා සරුසාර ය. පිටාර නිම්නය හැඳින්වීමට ඩෙල්ටාව (Delta) යන පදයද භාවිත වේ.*